

මිහායිලෝ ස්තෙල්මාහ්

මාළු බාන බළල් රාළ

පරිවර්තනය
රන්ජන දේවමිත්‍ර සේනාසිංහ

මාළු බාන බළල් රාළ

හිරු නැගෙනට පෙර නැඟිලා
බාල්කය හරහ පැනලා
මාළු බාන්නට කියලා
බළලා වැව වෙත දුවලා

ඉවුරේ ඉඳගන්ටත් පෙර
බිලී කොක්ක දැමි විසි කර
දෙපැයක් ගෙවිලත්, සුමිතුර
බලා සිටී සිත රොස් කර

"බළල් රාළෙ කෝ ඇල්ලූ මාළු
උඹ කමකට නැති ධීවරයෙක් ලූ
රුවටී ගිලිනුව බිලි කටු, යාලූ
එහි ඇමිණූ පණුවකු නම් නැලූ"

බීවරයා

දිවා රෑ වෙහෙසිලා
බීවරයො වැඩකළා
මහන්සිය නොමබලා
කෑම තොග රැස්කළා

සීත කාලෙට ගන්න මුළු ගේම පිරෙව්වා
බිම් මහල වැහෙන්නම දර තොගත් රැඳෙව්වා
මඩුව පිරවෙන්නටම බඩුත් ගොඩ ගැහැව්වා
පෙට්ටගමටත් ඕනෑ හැම දේම පැටෙව්වා

බීවරයම හෑව නිසා
බීවරයම වැපුරු නිසා
බීවරයම කැපූ නිසා
බීවරයම කෙටූ නිසා



අලසකමක් නොවූ නිසා
වෙරවීරිය කරපු නිසා
දහඩිය ගත හෙළු නිසා
ගතේ සවිය රැඳුණු නිසා

ගිමන් හරින්නට මොහොතක්
වෙතොත් නොවේමැයි අවැඩක්
එහෙත් ඊට නැත ඇල්මක්
නොවේ වැඩට වැඩි සතුටක්

ගඟ මැදින් වේල්ලක් බඳින හැටි උගන්වයි
තාත්තට කන් දෙන්න, දඟ වුවත් මනාපයි

ලෑලි පාලම දිගේ ගඟෙන් එගොඩට වෙන්න
අම්ම එනවා පැටවු ටිකට කන්නට දෙන්න
දැන් ලිපෙන් බා ගත්ත උණු මාළු ටික ඇන්න
කූඩයක් පුරාගෙන ආවේ දහවලෙ කන්න



කොක් අප්පු

පාන්දරින් කොක් අප්පු නැඟිටලා
බැටළු රංචුවට තණ කොළ කපලා
එහෙම පිටින් මිටියක් ගොඩ ගහලා
ලී කඳකින් බත් ඔරුවක් හදලා

"බැටළුවනේ මෙහෙට එන්න
රසැති පලා කපා ඔන්න
බත් ඔරුවේ දමා මෙන්න
බඩ පිරෙන්න කාල යන්න"

"ඒක නොකා තණ මිටියට
හොඹු ලෑවොත් කැත විදියට
හැමට ගන්න පාඩමකට
කඩනව අං දෙක ඇත්තට"



කොක් රාළ
කෙකටිය දලු මැලවූ හැටි

වෙල් යායේ ඇවිදලා
උදේ හිටන් ඇහිඳලා
කෙකටිය දලු මලවලා
කෑමට පිළියෙල කළා

එතකොට මහ වැහි වැටුණා
මැල්ලුම වතුරෙන් පෙඟුණා
කොක් රාළට දුක හිතුණා
බඩගින්නෙම ඉන්න වුණා

කෙකටිය දලු එදා පටන්
කන්න පුරුදු විය අමුවෙන්

වළසාට පිහිටක් වන්නේ කෙසේද ?

මාදං ගස්වල කොළ හැලෙනා තැන
අඹ, නාරං ගස් අතු ලෙලවන තැන
සිටවූවා රඹුටන් ගහකුත් ගෙන
වළස් පැටවු සැම හරි පිරියෙන් කන

පායන කාලෙදි වියැළී ගිය ගස
ගෙනාවෙ නෑ නෙවැ සිතූ සේ පල රැස
පනිවිටුවක් ගෙන ගියේය නොවලස
කුමට ඉතින් ඇළ දිය ගෙනෙනට මිස

මහ අකරතැබ්බයකි-වළස් හාමිට දුකකි
බාල්දියෙ යට හිලකි-දිය නොරඳනා සෙයකි

දුකට පත් වළසාව-මේ රූපෙ ඇඳ තියේ
පිරියමක් කරලන්න-කොස් ලාටු කොහි තියේ

වළසාව සනසන්න සමත් අය සිටිත්ද්ෝ?
පැලවලට වතුර ලෑමට මඟක් කියද්ද්ෝ?

මේ සතා මොකෙක්ද්ෝ?

හැම අත හිම වැටිලා ඇත
ගොයම් කොළය යටවී ඇත
දිය කඩිත්ත වැසිලා ඇත
කැලයෙද හිම වැතිරී ඇත

කවුද කෙනෙක් ලණුවක් ගෙන
හිම පියලින් ගැවසී ගෙන
තිබෙන ගොයම් ගොඩ පතුලෙන
ඒ ඇතුළට රිංගා ගෙන

ගොයම් මිටක් ඩැහැ ගත්තා
පිටේ තියා බැඳ ගත්තා
හෙමින් මඟට බැස ගත්තා
පරෙස්සමෙන් පැන ගත්තා

දුවලම ගෙදරට
ආවා හනිකට
"ළමයිනි විගහට
අරිනුව දොර මට"

"උඩු රැවුලැති
දිග කන් ඇති
වපරුස් ඇති
සුදු බඩ ඇති
මෙ කවුරු වෙති?"

හාවට නිදිමත හැඳිලා

හාවට නිදිමතක් දැනුනා
රෙද්දයි කොට්ටෙයි ගෙනාවා
තණ බිස්සේ රෙද්ද එලුවා
කොට්ටෙන් හිස තබාගත්තා

හාවගෙ කන් දිගට දිගයි
කොට්ටෙන් පහළට එල්ලෙයි

බිම්මල්-අම්මා
තොප්පි ගෙනැල්ලා

බිම්මල්-අම්මා පොළට ගිහිල්ලා
දරු පැටවුන් හට තොප්පි ගෙනැල්ලා

"බිම්මල්-දරුවන් හිස ඔසවන්නේ
තොප්පි නැතොත් පෑගී මියයන්නේ"

තාත්ත තැතිගෙන දුවගෙන එන්නේ
තොප්පි උනාලන්නට අණදෙන්නේ

"මල්ලක් ගෙන කෙල්ලක් ඇවිදින්නේ
දුටුවොත් හතු මාළුවටයි යන්නේ"



කොට්ටෝරුවා

කොට්ටෝරුව ඇස් පෙනීම දුරුවල
දුවගොස් කණ්ණාඩි ගෙනාව වෙත පොළ

නැහැය උඩින් කණ්ණාඩි දෙක සවිකොට
කරනව වැඩ කැලයේ ගජරාමෙට

සීත කාලෙ ළංවීගෙන එනකොට
කුරුමිණියන් හැංගෙනවා පොතු යට
ගස් කඳ පිරික්ස බලලා මොනවට
ගිලදමනව එකෙකුව එක කටකට

වයසට ගිය මුත් කොට්ටෝරුව හට
බඩගින්නක් දැන් නොදැනේ කිසිවිට

Kanol

Kanol Publishing House
1196/4, Kottawa Road, Pannipitiya
Tel: 011 4336778, 071 3493447
kanolpublish@gmail.com

ISBN 978-955-1979-61-4

Rs. 125/-